" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 | SLSI | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2020 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2020-06-10

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරී,

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020, 07/2020(I) හා 07/2020(II) බස්නාහිර පළාතට අදාල කර ගැනීම.**

පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2 හා 2020.05.14 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020, 2020-03-26 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(I), 2020-03-29 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(II), 2020-04-04 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්, ආයතන ප්‍රධානින් හා නිලධාරින් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.ජී. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2020(II)

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.04.04

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම</u>**

ඉහත මැයෙන් නිකුත් කළ 2020.03.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020 හා 2020.03.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020(I)ට වැඩිමනත්වය.

02. සියලුම රජයේ නිලධරයන්ට වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල II කොටසේ අත්තිකාරම් ගිණුම්වල, “රජයේ නිලධරයන්ට අත්තිකාරම්” යන ශීර්ෂය යටතේ ලබා දී ඇති ණය වෙනුවෙන් ඔවුන්ගේ වැටුපෙන් අයවිය යුතු ණය වාරික සහ ණය පොළිය අයකිරීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට 2020.04.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. මෙම චක්‍රලේඛය ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/චක්‍රලේඛ/18/2020 හා 2020.03.30 දිනැති චක්‍රලේඛ උපදෙස් පරිදි මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන අතර රජයේ නිලධරයන් විසින් ලබාගෙන ඇති අනෙකුත් ණය වෙනුවෙන් ඔවුන්ගේ වැටුපෙන් අයවිය යුතු ණය වාරික සහ ණය පොළිය අයකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් නිකුත් කර ඇති උපදෙස් අනුව අදාළ ආයතන විසින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය